www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා මිලිටරිය යුද විරෝධී කලාකරුවන්ට තර්ජනය කරයි

## Sri Lankan military threatens antiwar filmmakers

**නන්ද වික්‍රමසිංහ විසිනි**
**2005 සැප්තැම්බර් 28**

පසු ගිය සති දෙක තුල, ශ්‍රී ලංකාවේ මිලිටරිය සහ දිග්ගැසුනු සිවිල් යුද්ධය පිලිබඳව තම සිනමා කෘතීන් මගින් විවේචනශීලී වූ චිත්‍රපට නිෂ්පාදකයන්ට විරුද්ධව සන්නද්ධ හමුදාවල ජ්‍යෙෂ්ඨ නිලධාරීහු, යාන්තමින් පමනක් වැසැංගුනු තර්ජන මාලාවක් නිකුත් කලහ. මෙම ක්‍රියාව ප්‍රජාතන්ත්‍ර අයිතීන් අමුඅමුවේ ම උල්ලංඝනය කිරීමක් හා ''නිර්පාක්ෂික'' සන්නද්ධ හමුදා දේශපාලන ජීවිතය තුලට කඩා වැදීමක් පමනක් නොව හමුදාවේ ප්‍රධානිහු යුද්ධයකට සූදානම් වෙමින් සිටින්නාහු ය යන්න පිලිබඳ පැහැදිලි අනතුරු හැඟවීමක් ද වේ.

සන්ඩේ ටයිම්ස් පුවත්පතට අනුව සන්නද්ධ හමුදාවේ නිල කථක බ්‍රිගේඩියර් දයා රත්නායක ද රෙයාර් අද්මිරාල් සරත් වීරසේකර ද එක්ව නම් නොකරන ලද වෙලඳ ප්‍රචාරක ඒජන්සියකදී ප්‍රමුඛ යුද විරෝධී සිනමා අධ්‍යක්ෂවරුන් ගනනාවක් සමග නිල නොවන හමුවක් පැවැත්වූහ. එම පුවත්පත් ලිපියට අනුව රත්නායක හා විජේසේකර ''යලි යුද්ධයක් ඇවිලී ගියහොත් එහි විපාක මෙම චිත්‍රපට නිෂ්පාදකයින්ට මුහුන දීමට සිදුවනු ඇතැ''යි අනතුරු ඇඟවීමක් කොට ඔවුන් ''හමුදාව වෙනුවෙන් ද චිත්‍රපට නිර්මානය කල යුතුය'' යි බලකර සිටියෝ ය.

හමුදා නිලධාරීන් ඉලක්ක කල චිත්‍රපටවලින් එකක් මේ වර්ෂයේ කැන්ස් චිත්‍රපට උලෙලේ දී ත්‍යාගයක් දිනා ගත් 'සුලඟ එනු පිනිස' නම් චිත්‍රපටය යි. අනෙක්වා නම් අසෝක හඳගමගේ 'මේ මගේ සඳයි', ප්‍රසන්න විතානගේ 'ඉර මැදියම' සහ සුදත් මහදිවුල්වැවගේ 'සුදු කලු සහ අලු' යන නිර්මාන යි.

හමුදා නිලධාරීන් චිත්‍රපට අධ්‍යක්ෂවරුන් හමුවීම වනාහී සිනමාකරුවන් ද වෙනත් කලාකරුවන් ද බිය ගැන්වීම සඳහා සකසා මෙහෙයවන ලද ව්‍යායාමයක අලුත්ම පියවරය ය. මෙම ව්‍යායාමය ඇරඹුනේ සැප්තැම්බර් 4 දා සන්ඩේ ටයිම්ස් පුවත්පතේ පල වූ රෙයර් අද්මිරාල් වීරසේකරගේ ''යුද්ධය, කලු සිනමාව සහ හේවායාගේ චිත්ත ධෛර්යය'' නම් පරිකථනයෙනි. මෙම චිත්‍රපට යුද්ධයට එරෙහිව පෘථුලව පැතිරගිය මහජන හැඟීමට යොමුවී පැවතීම ගැන පැහැදිලිවම සංවේදී වූ නාවුක නිලධාරියා මෙසේ ප්‍රකාශ කලේ යඃ

''අද යුද්ධය වනාහී ජාතික ප්‍රශ්නයකි. එහෙයින් මගේ මතය නම්, යුද්ධය පිලිබඳ චිත්‍රපටයක් නිර්මානය කරන කවරෙකු වුවත් එය කල යුත්තේ ඉතා සුපරීක්ෂව බවය. ඕනෑම පුද්ගලයෙකුට සමාජය හා සමාජ ජීවිතය මත යුද්ධය ඇති කරන සෘජු බලපෑම, පෙන්නුම් කරන චිත්‍රපට ඕනෑ නම් නිෂ්පාදනය කල හැකි ය. එහෙත් එවන් චිත්‍රපට මගින් හේවායන්ගේ සේවාව හෙලා දකිනු ලැබේ නම්, හේවායා ද ඔහුගේ බිරිඳ ද අවමානයට පත් කෙරේ නම්, රටේ තරුනයන් යුද්ධයට බඳවා ගැනීමේ හැකියාව, අධෛර්යයට පත් කොට හීන කර දමනු ලැබේ නම් ඉන් පෙන්නුම් කෙරෙන්නේ අපේ විරෝධය දක්වීමට කාලය එලඹ ඇත''යි යන්න ය.

ජීවිත 60,000කට වැඩි සංඛ්‍යාවක් විනාශකර දමා දිවයින පුරාම යෝධ දුක් වේදනාවන්ට මග පෑදූ මෙම යුද්ධයේ මෘග යථාර්ථය විදහා දැක්වීමට එරෙහිව වීරසේකර යෝජනා කර සිටින්නේ, ''මගේ මතයට අනුව යුද්ධය, සොල්දාදුවාට ආදරය හා දයාව ලබා දීම අරමුනු කොට ගත් සිනමා කෘතීන් ද ඊට ඇතුලත් කොට චිත්‍රපටය අවසන් වන කල්හි ප්‍රේක්ෂකයාගේ සිතෙහි සොල්දාදුවා පිලිබඳ ගෞරව සම්ප්‍රයුක්ත පින්තූරයක් මැවිය යුතු ය'' කියා ය.

වීරසේකර තම ලිපිය අවසන් කලේ මෙසේ ප්‍රකාශ කරමිනිඃ ''යුද්ධය පිලිබඳ චිත්‍රපටයක් සිතාමතාම වක්‍රව වුවත් ත්‍රස්තවාදීන්ගේ අරමුනු සපුරාලීමට ප්‍රතිපදානයක් කරන්නේ නම්, එය රාජ ද්‍රෝහී වන්නේ යත ඒ අනුව සැලකුම් ලැබිය යුතුය.'' ශ්‍රී ලංකාවේ දේශපාලනයේ භාෂාවෙන් ගත් කල්හි මෙම දුෂ්ට පනිවුඩය ට ඇත්තේ එකම එක අර්ථයකිඃ එනම් දෝෂ දර්ශනයට ලක් වූ චිත්‍රපට නිෂ්පාදකයන් නීතිමය දන්ඩනයට සහ ඝාතක ප්‍රහාරයන්ට - කෙලින්ම මිලිටරිය මගින් නැතිනම්, ඔවුන් හා සම්බන්ධ සිංහල අන්තවාදී කල්ලි කන්ඩායම් අතින් - ලක් කෙරෙනු ඇතැයි යන්න යි.

වීරසේකරගේ ලිපියට පසුව 13 දා හමුදා නිලධාරීන් තිදෙනෙක් ජාතික චිත්‍රපට සංස්ථාවට (එන්එෆ්සී) ගියහ. රෙයාර් අද්මිරාල්වරයා ද, බ්‍රිගේඩියර් රත්නායක ද නම් නොකල ගුවන් හමුදා නිලධරයෙක් ද එහි සභාපතිවරයා හමුවූහ. මාධ්‍ය වාර්තා ගනනාවකට අනුව රත්නායක ප්‍රස්තුත චිත්‍රපටවලට දෙන ලද ජාත්‍යන්තර සම්මානය ඒවා රාජද්‍රෝහී යන චෝදනාවට තවදුරටත් තහවුරු කරලීමට යොදා ගත්තේ ය. මේ චිත්‍රපට, ''විදේශ මුදල් යොදා තනන ලද සිනමාවක්'' යයි චෝදනා කල හෙතෙම මෙම අධ්‍යක්ෂවරුන් විදේශීය ස්වාමීන්ගෙන් ගෙවීම් ලබන්නන් යයි ඇඟැවී ය.

චිත්‍රපටි සංස්ථා සභාපතිවරයා හමුවූ මිලිටරි නියෝජිතයෝ ''සන්නද්ධ හමුදාවන් හිතා මතා ප්‍රහාරයට ලක් කල'' චිත්‍රපට අනුමත කිරීම ගැන චෝදනා කලහ. රත්නායක ඉනුත් ඔබ්බට ගිය බව එක් පුවත්පතක් වාර්තා කලේ ය. එයට අනුව ඔහු යුද්ධ විරෝධී චිත්‍රපට ''නව වර්ගයක ත්‍රස්තවාදයක්'' යයි හංවඩු ගැසුවේ ය. චිත්‍රපට නිෂ්පාදකයන් ''සන්නද්ධ හමුදාව විහිලුවට භාජන කිරීමට සපථ කර සිටින එල්ටීටීඊ සංවිධානය පිනවන ත්‍රස්තවාදී ප්‍රචාරයේ වාහකයන් ය''යි ඔහු ප්‍රකාශ කලේ ය.

දේශපාලන සංස්ථාපිතයේ කවරෙකු හෝ මේ තර්ජන පිලිබඳව හමුදා නිලධාරීන් විවේචනයට ලක් කොට නැතත ඔවුන් විනයගත කිරීමට කිසිවක් ද කර නැත. ඒ වෙනුවට කර ඇත්තේ බන්ඩාරනායක අනුස්මරන ජාත්‍යන්තර ශාලාවේ සැප්තැම්බර් 7-18 දක්වා පැවැත්වුනු පොත් ප්‍රදර්ශනයේ දී නියමිතව තිබුනු සුලඟ එනු පිනිස චිත්‍රපටයේ ප්‍රදර්ශනය මිලිටරි නිලධාරීන් සහ චිත්‍රපටසංස්ථාව අතර සාකච්ඡාව සිදු වූ දිනයට පසු දින නවතා ලීම ය.

## යුද්ධ තර්ජනය

චිත්‍රපට නිෂ්පාදකයන්ට එරෙහි හමුදා තර්ජන සිදුවෙමින් පවතින්නේ යුද්ධය පිලිබඳ ප්‍රශ්නය කේන්ද්‍ර කරගත් ජනාධිපතිවරන ව්‍යායාමයක් මැද්දේ ය. පාලක ප්‍රභුව, රාජ්‍ය යන්ත්‍රය ද ඇතුලුව දැන් පවත්නා සටන් විරාමය පවත්වාගෙන එල්ටීටීඊය සමග සාකච්ඡා දිගටම පැවැත්විය යුතු ද නැද්ද යන්න ගැන තියුනු ලෙස දෙපිල බෙදී පවතී. මෙයට එරෙහි එක් කොටසක් කියා සිටින්නේ යලිත් රට යුද්ධයට ඇද දැමිය යුතුය කියා ය.

මහා ජාවාරම්කරුවන්ගේ සහය ලබන එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂක රනිල් වික්‍රමසිංහ ''සාම ක්‍රියාවලිය'' ඉදිරියට ගෙනයා යුතු යයි කියා සිටින අතර ශ්‍රීලනිප අපේක්ෂක මහින්ද රාජපක්ෂ ජනතා විමුක්ති පෙරමුන සහ ජාතික හෙල උරුමය ඇතුලු සිංහල ජාතෝත්තමවාදී සංවිධාන සමග සන්ධානගතව සිටී. මේ සංවිධානවල ඉල්ලීම වන්නේ සුනාමි ආධාර බෙදා හැරීම සඳහා ආන්ඩුව ද එල්ටීටීඊයද අතර ඇතිකරගෙන තිබෙන පී-ටොම්ස් යාන්ත්‍රන එකඟතාවය අහෝසි කර දමන ලෙස ය. ඔවුහු දැන් ඇති කර ගෙන තිබෙන සටන් විරාමය යලිත් සාකච්ඡාවට භාජනය කරන ලෙස ද ඉල්ලා සිටිති.

පසු ගිය අගෝස්තු 12 දින විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනය කිරීමෙන් පසු එල්ටීටීඊයට එරෙහි දැඩි පිලිවෙතක් ගත යුතුය කියා සිටින ව්‍යායාමය තවත් උග්‍ර වී ය. සාක්ෂි සොයා ගත නොහැකි වුව ද, මාධ්‍යයන් හා දේශපාලන සංස්ථාපිතය එම ඝාතනය කලේ එල්ටීටීඊය යයි චෝදනා කලහ. ජවිපෙ හා ජාතික හෙල උරුමය මෙම අපරාධය අල්ලාගෙන තමන්ගේ ඉල්ලීම් සඳහා කන් හිරිවට්ටන උද්ඝෝෂනයන් උත්සන්න කිරීමට වැඩට බැසගත්තාහ. මෙවන් වැඩ පිලිවෙලක් එල්ටීටීඊයට පිලිගත නොහැකිවන අතර නිශ්චිතවම යුද්ධය කරා පාර කපා දෙයි.

දැන් ලංකාවේ මිලිටරිය ක්‍රියා කරන්නේ දේශපාලන වශයෙන් 'අක්‍රිය' සංස්ථාවක් ලෙස නොවේත අර්ධ දේශපාලන පක්ෂයක් ලෙස ය. එය යුද්ධයෙන් තත්වයක් ද ද්‍රව්‍යමය වාසිද දිනා තර වූ නිලධාරි කුලකයේ අවශ්‍යතා නියෝජනය කරයි. සිංහල ජාතෝත්තමවාදය ගැඹුරටම කාවැදුනු මිලිටරියේ ඉහල ලොක්කෝ, සටන් විරාමය ම ද්‍රෝහී ක්‍රියාවක් ලෙස සලකති.

2001-2004 සමයේ එක්සත් ජාතික පක්ෂය ආන්ඩුවේ ඉඳිද්දී, හමුදා නායකයෝ ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග සමග, සාම සාකච්ඡාවලට වල කැපීමට ද සටන් විරාමය කඩාකප්පල් කිරීමට ද සඳහා එල්ටීටීඊ යාත්‍රාවන්ට විරුද්ධව නාවුක ප්‍රහාර ගනනාවක්ම දියත් කිරීමට එක්ව කටයුතු කලහ. පසු ගිය වර්ෂය තුලදී මිනීමැරුම් හා සන්නද්ධ ගැටුම් වශයෙන් එල්ටීටීඊයට එරෙහි එකට එක කිරීමේ ව්‍යායාමයෙහි යෙදුනු එල්ටීටීඊයෙන් බිඳී ගිය කරුනා කන්ඩායමට සන්නද්ධ හමුදාවල රහසිගත සහාය ලැබී ඇත. මෙම සට්ටනය සටන් විරාමය බිඳ දැමීමට තර්ජනය කර සිටී.

රෙයාර් අද්මිරාල් වීරසේකර සිනමාකරුවන්ට තර්ජනය කර සිටීම අහම්බයක් නො වේ. ඔහු ත්‍රිකුනාමලය වරාය මත පදනම් වූ නැගෙනහිර ප්‍රදේශයේ නාවුක ආඥාපති ද උතුරු නැගෙනහිර දිස්ත්‍රික්කයේ මිලිටරි ආරක්ෂාව භාර නිලධාරියා ද වූයේ ය. පසු ගිය මැයි මාසයේ දී සිංහල අන්තවාදීන් ත්‍රිකුනාමල මධ්‍යයේ බුද්ධ ප්‍රතිමාවක් ඉදිකර ප්‍රදේශයේ දෙමල ජනයා ප්‍රකෝප කර ජාතිවාදී ආතතිය උග්‍ර කල අවස්ථාවේ දී ඔහු සටන් විරාමයට දක්වූ විරුද්ධත්වය ඉතා පැහැදිලි විය. වීරසේකර මෙම ප්‍රකෝපකරනයට විවෘතව සහාය දුනි. එය කෙතරම් විවෘත වී ද යත් ඔහුව එම ප්‍රදේශයෙන් එලියට මාරුකර යැවීමට ජනාධිපති කුමාරතුංගට සිදු විය.

එහෙත් වීරසේකර විනයගත කිරීම සඳහා දඬුවමක් හෝ අවවාදයක් ලද්දේ නැත. ඒ වෙනුවට ඔහු නාවුක මධ්‍යස්ථානයේ නියෝජ්‍ය මාන්ඩලික ප්‍රධාන යන විශේෂයෙන් නිර්මානය කරන ලද තනතුරට පත් කරනු ලැබී ය. මිලිටරියේ ඉහල නිලධාරින්ගේ කොටස් තුල සටන් විරාමය පිලිබඳ පවත්නා අසන්තුෂ්ටිය හා අමනාපය පිලිබිඹු කරමින් හෙතෙම සටන් විරාමයට එරෙහිව උද්ඝෝෂනය දිගටම ගෙන ගියේ ය. ඩේලි මිරර් පුවත්පතට අනුව ජුලි මාසයේ දී පූනානි නාවුක අභ්‍යාස කඳවුරේ පිටව යාමේ උත්සවයක් ඇමතූ හෙතෙම, එල්ටීටීඊයට එරෙහිව ක්‍රියා කිරීමට අසමත්වන අය ''බයගුල්ලන් හා දුබල සිතැතියන්'' ලෙස හඳුන්වා ලී ය.

ජුලි 26දා, ජනාධිපති කුමාරතුංග විසින් කැඳවනු ලැබූ ඉහල හමුදා නිලධාරීන් ගේ සාකච්ඡාවක දී එල්ටීටීඊය සමග ඇති කර ගත් ඒකාබද්ධ සුනාමි ගිවිසුමක් ක්‍රියාත්මක කිරීමට කුමාරතුංග ඔවුන්ගේ සහාය ඉල්ලා සිටි කල්හි රෙයාර් අද්මිරාල්වරයා ජනාධිපතිවරිය ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යලි ක්‍රියාත්මක කල යුතු යයි ද එසේ නැත හොත් නැගෙනහිර ප්‍රදේශයේ එල්ටීටීඊ වැඩ කටයුතු මර්දනය කිරීම සඳහා හදිසි තත්වයක් ප්‍රකාශකල යුතුව ඇතැයි ද කියා සිටියේ ය.

ඔහුගේ අලුත්ම පියවරයන්ට පෙර වීරසේකර එක්තරා ජාතියක ''තනි මැර'' නිලධාරියෙකැයි සමහර විට නොතකා හැරිය හැකිව තිබුනි. එහෙත් චිත්‍රපට නිෂ්පාදකයන්ට එරෙහිව ඔහු යෙදී ගත් මෙම ප්‍රකෝපකාරී ව්‍යායාමය පෙන්නුම් කරන්නේ ඔහු හමුදාවේ ආඥාපති ස්ථරයේ ඉහලම තට්ටුවල අනුමැතිය ඇතිව ක්‍රියා කරන බව ය. මෙම අනතුරු හැඟවීම හුදෙක් කලාකරුවන්ට එරෙහිව එල්ල කරන ලද්දක් නො වේ. එය වනාහී රට යුද්ධයට ආපසු ඇද ගෙන යාමට එරෙහිව කතා කරන මාධ්‍යවලට හා වෙනත් කවුරුන්ට වුව එරෙහිව එල්ල වූවකි. දැන් ජනාධිපතිවරනයක් මැද දී වැඩට බැස ගැනීමෙන් මිලිටරිය අපේක්ෂා කරන්නේ මැතිවරන ප්‍රතිඵලවලට බලපෑමක් කිරීමට බව ද පෙනී යයි.

මොවුහු සිනමාකරුවෝ පහසු ඉලක්කයක් බවට පත් කරගෙන සිටිති. හමුදාවේ දෙදරායන ධෛර්යයද ඉහලයන සේවයෙන් පලායාමේ සංඛ්‍යාවන් ද යන මේවාට දෝෂය පැවරීම සඳහා දඩමීමුන් ලෙස ඔවුන්ව යොදා ගෙන තිබේ. එහෙත් මෙම චිත්‍රපට ඉහත සඳහන් පලායාම් තත්වයන්ට හේතුව නොවේත ඒ වෙනුවට ඒවා පිලිබිඹු කරන්නේ සාමාන්‍ය සොල්දාදුවන් ද ඇතුලු පලල් මහජනතාවගේ පලල් හැඟීම් හා ආකල්පයන් ය. සාමාන්‍ය සොල්දාදුවන්ගෙන් වැඩි කොටස ලංකාවේ දිලිඳුකම රජයන ගම්බද පලාත්වලින් ආර්ථික දුෂ්කරතා නිසා රස්සාවට යුද්දෙට බැඳුනවුන් ය. 140,000ක් පමන වූ හමුදාවෙන් 2002 සටන් විරාමය එලඹෙනවිට පලා ගිය සංඛ්‍යාව 50,000ක් තරම් ඉහල සංඛ්‍යාවකි.

''හේවායාට ආදරය හා අනුකම්පාව'' ආඩම්බරය දනවන සමාජ්තීන් ද ඇතුලත් චිත්‍රපට නිපදවන ලෙස වීරසේකර කරන කැඳවුම වනාහී යුද්ධය සඳහා මහජන මතය සූදානම් කිරීමට මිලිටරිය සැරසෙන බවට පැහැදිලි අනතුරු හැඟවීමකි.

ප්‍රධාන පක්ෂ ද මාධ්‍යයන් ද රෙයර් අද්මිරාල්ව විවේචනය කිරීමට හෝ සිනමාකරුවන්ගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීමට ඉදිරිපත් නොවීම ඉතා එලිදරව්කාරී ය. පාලක ප්‍රභූවේ කොටසක් එල්ටීටීඊය සමග සාකච්ඡා විසඳුමක් සොයා සිටින අතර ඔවුන් සියල්ලෝම සිංහල ප්‍රජාගනවාදී ගොහොරුවේ ගැලී සිටිති. එහෙයින්ම මිලිටරියේ යුද්ධ ඝෝෂනයට අභියෝග කිරීමට ඔවුහු අසමත් වෙති. මෙම චිත්‍රපටි නිෂ්පාදකයන්ගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි මිලිටරියේ ප්‍රහාරය හෙලා දකින සමාජවාදී සමානතා පක්ෂය කම්කරුවන්, තරුන ජනයා, සහ බුද්ධිමතුන් මෙම සිනමාකරුවන්ගේ අයිතීන් ආරක්ෂාවට ඉදිරිපත් විය යුතු යයි කියා සිටී.

දැන් හමුදාව දේශපාලන ජීවිතයට මේ ආකාර කඩා වැදීම වනාහී රටේ මහජනතාවට තිත්ත වී ඇති යුද්ධය කරා ආපසු යන්නේ නම් එය කෙලින්ම සකල මහජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි ම්ලේච්ඡ ප්‍රහාරයක් ද ඇති කරනු ඇතැයි යන්න පිලිබඳව තියුනු අනතුරු හැඟවීමකි.

මෙම භයානක අනතුරට එරෙහිව සටන් කිරීම සඳහා පවත්නා කුමන ධනපති පක්ෂයක් කෙරේ හෝ විශ්වාසය තැබිය නොහැකි ය. ඒ වෙනුවට කම්කරු පන්තිය ස්වාධීන සමාජවාදී වැඩ පිලිවෙලක් උඩ බලමුලුගැන්විය යුතු ය. අප අපගේ පාඨකයන්ට හා ආධාරකරුවන්ට කියා සිටින්නේ, ශ්‍රී ලංකාවේ ද, දකුනු ආසියාවේ ද, ජාත්‍යන්තරවම ද කම්කරු පන්තිය මෙම ඉදිරිදර්ශනය මත ඒකාබද්ධ කිරීමට සටන් වදින්නාවූ සමාජවාදී සමානතා පක්ෂයට ද එහි ජනාධිපති අපේක්ෂක විජේ ඩයස්ට ද ආධාර කරන ලෙස ය.